පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.21 පැය 1110 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /796 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම

2025.04.21 වන අද දින උදෑසන කාලයේ ගලේවෙල පොලිස් වසමේ අඹේපුස්ස ත්‍රිකුණාමලය මාගර්යේ බෙලිගමුව මහ කඩේ හන්දිය ආසන්නයේදී ගලේවෙල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය කළ යතුරුපැදියක් පාර හරහා ගමන් කළ සුනඛයෙකුගේ ගැටී යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකිව මාගර් අයිනේ වු කාණුවට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන් කළ යතුරුපැදිකරු, පසුපැදිකාරිය හා  කුඩා පිරිමි දරුවෙකු තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු හා පසු පැදිකාරිය මිය ගොස් ඇති අතර කුඩා පිරිමි දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා දඹුල්ල රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන හා මරණකාරිය වයස අවුරුදු 21 ක් වන දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘතශරීර ගලේවෙල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගලේවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**